# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,266 - 2022 පෙබරවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 38 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 40 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 පෙබරවාරි මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 පෙබරවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### ගම්පහ දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : 169/MB
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. මිලියන 1.8 යි.
ගම්පහ දිසා අධිකරණයේ
ඇස්කීසි අංකය : 88/19

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ දෙල්ගොඩ නව නුවර පාරේ, අංක 351 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී.

*................පැමිණිලිකරු.*

*එදිරිව*

වැලිවේරිය, නව නුවර පාරේ, අංක 30/14 දරන ස්ථානයේ ෂයිනි සෙලියුලර්ස් සෙන්ටර් යන නාමය විලාශය හා ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන මාලුගේ සජීව රොෂාන් ඩයස්.

*....................විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා හට නිකුත් කරන ලද අධිකාරි පත්‍රයට අනුව විත්තිකරු වන ෂයිනි සෙලියුලර්ස් සෙන්ටර් යන නමින් ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යන මාලුගේ සජීව රොෂාන් ඩයස් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට ඒකපාර්ශ්වික තීන්දු ප්‍රකාශයෙන් නියම කර ඇති රු. 1,397,770.12ක මුදල 2012 ජූලි මස 01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වර්ෂයකට 18.5% බැගින් පොළිය ද සමඟ ගෙවන මෙන් ද, සහ රු. 146,325.54ක මුදල 2012 ජූලි මස 01 දින සිට සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තෙක් 23.5% බැගින් පොළිය ද සමඟ ගෙවීම පැහැර හැර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර වන දේපල,

**වර්ෂ 2022 ක් වූ මාර්තු මස 22 වැනි දින පෙ.ව. 11.00 ට විත්තිකරුගේ දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.**

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් සියයට විසිපහ (25%) ක මුදලක් ද, පිස්කල් ගාස්තු, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේම මුදලින් වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ක ඉතිරි මුදල දින 30ක් ඇතුලත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*දේපලට ප්‍රවේශ වන මාර්ගය.-* දෙල්ගොඩ මාර්ගයේ සිට නැදුම්ගමුව පාරේ මීටර් 300ක් පමණ ඉදිරියට ගොස් වමට ඇති බොරලු පාරේ මීටර් 250ක් පමණ ඉදිරියට ගොස් දකුණට ඇති අඩි 12ක් පමණ පළල පාරේ මීටර් 30ක් පමණ ඉදිරියට ගිය විට පාර අවසානයේ වම්පස මෙම දේපළ පිහිටා ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, නැදුන්ගමුවෙහි පිහිටි ''මිල්ලගහවත්ත'' *හෙවත්* ''ගලවත්ත'' නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන කොටසට බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 6951B සහ 1999/08/09 දිනැති පිඹුර ප්‍රකාර මායිම් උතුරු නැගෙනහිරට : දෙවටෙන් ද, දකුණු නැගෙනහිරට : ලොට් 2 සහ ලොට් 6න් ද (අඩි 12ක් පළල පාර) න් ද, දකුණු බස්නාහිරට : ලොට් 6 ද (අඩි 12ක් පළල පාර) සහ ලොට් 7න් ද, උතුරු බස්නාහිරට : එච්. එච්. ෆොන්සේකාගේ ඉඩමෙන් මායිම් වූ රූඩ් 1ක් (රූ. 1) ක් විශාල ඉඩම ගොඩනැගිලි ගහකොළ සහ සියළු දේත් සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 571/258 යටතේ ලියාපදිංචි කර ඇත.

ජී. එම්. රමනී වීරසිංහ,
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමවිනිසුරු/ප්‍රොබේට් නිලධාරි,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2022 ජනවාරි මස 25 වැනි දින දී ය.

02-40

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### කොළඹ දිසා අධිකරණයේ දී ය

සංශෝධිත පරිදි වූ 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඊට අනුකූලව නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ කොළඹ 11, කෙලින් වීදියේ, අංක 149-151 හි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන,

නඩු අංකය : ඩී.ඩී.ආර්. 749/18
ස්වභාවය : ඩී.ඩී.ආර්.
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : 2,300,000/-
ඇස්කිසි අංකය : 27/2021

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී.,
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

....................*පැමිණිලිකරු.*

*එදිරිව*

ශ්‍රීජා සෙරමික් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 92/බී, නාවල පාර,
නුගේගොඩ.

*කා : ස : 11 අනුව, විත්තිකරුගේ නව ලිපිනය :*

අංක 223/20 සහ 223/21, පුබුදු මාවත, මත්තේගොඩ.

.....................*විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ විත්තිකරුට එරෙහිව වර්ෂ 2020ක් වූ පෙබරවාරි මස 26 වැනි දින නියතකර ඇති නෛසයි තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, එකී විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත රු. 2,300,410.51 ක් වූ මුදලක් සහ වර්ෂ 2017ක් වූ ජූලි මස 20 වැනි දින සිට එකී සම්පූර්ණ මුදල ගෙවා නිමකරන තෙක් ඒ සඳහා වර්ෂයකට 15.55% බැගින් වාර්ෂික පොළිය නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට ආඥකොට තීන්දු ප්‍රකාශ කර ඇත.

තව ද, එකී විත්තිකරු එකී මුදල් නිසි පරිදි ගෙවීම පැහැර හැර ඇති බැවින්, එකී නඩුවෙන් නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලයපිට නිසි ලෙස තහනමට ගෙන ඇති, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන එකී විත්තිකරුට අයත් ඇති නිශ්චල දේපලෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදල සෑම සියලු දේ,

**වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 18 වැනි දින පෙ.ව. 11.00 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 587 මත්තෙගොඩ බටහිර ග්‍රාම නිලධාරි වසමේ, මත්තේගොඩ පුබුදු මාවතේ වරිපනම් අංක 223/20 සහ 223/21 දරන 'මත්තෙගොඩවත්ත' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදොල විසින් වර්ෂ 2009 අප්‍රේල් මස 25 වැනි දින මැන සාදන ලද අංක 2009/26 දරන පිඹුරුපතේ නිරූපිත ලොට් 'ඒ' දරන, උතුරට : ගාමිණී රාජසූරියගේ අංක 2429 දරන පිඹුරේ ලොට් 'ජී' ද, නැගෙනහිරට : ඉන්ද්‍රානී මීපාගලගේ අංක 585 දරන පිඹුරේ ලොට් '3' ද, දකුණට : අඩි 20 පළල පාර ද සහ බස්නාහිරට : අංක 95/35 දරන පිඹුරේ ලොට් '1' ද යන මෙකී මායිම් තුල පිහිටි එකී අංක 2009/26 පිඹුර ප්‍රකාර පර්චස් විස්ස (පර්. 20) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A 303/123 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, ඒ සමඟ බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදෙල විසින් වර්ෂ 1995 අගෝස්තු මස 22 වැනි දින මැන සාදන ලද අංක 95/35 දරන පිඹුරුපතේ අඩි 20ක් පළල මාර්ගයක් සඳහා වෙන් කර ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

*දේපල පිහිටීම.-* මෙම දේපල කොට්ටාව හන්දියේ සිට පොල්ගස්ඕවිට පාරේ කිලෝමීටර් 3 1/2ක් පමණ ගමන් කළ විට හමුවන මත්තේගොඩ නගරයෙන් දකුණට වැටී ඇති පුබුදු මාවතේ මීටර් 50ක් පමණ ගමන් කලවිට දකුණට වැටී ඇති 1 වැනි පටුමගේ තවත් මීටර් 150ක් ඉදිරියට ගමන් කලවිට එම මාර්ගයටම මුහුණලා දකුණු පසින් මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්, (i) ගැනුම් මිලෙන් 25%ක් ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාරව පිස්කල්ගේ ගාස්තු ද, (iii) විකුණුම සඳහා වන සියලුම වියදම් ද මුදලින් ගෙවිය යුතු ය. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහ (30) ක් ඇතුලත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

ටී. පී. එස්. සේනානායක මිය,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ප්‍රොබේට් නිලධාරි/සාම විනිසුරු,
දිසා අධිකරණය, කැස්බෑව.

වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 20 වැනි දින දී ය.

02-29

---

# නොතාරිස් ලැයිස්තුව

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

පන්සල ඉදිරිපිට, යටිපිල, මිරිස්ස දරන ස්ථානයේ පදිංචි චාමනි දිනේෂා පල්ලියගුරු වන මම, මාතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 වැනි අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

චාමනි දිනේෂා පල්ලියගුරු.

2022 ජනවාරි මස,
පන්සල ඉදිරිපිට,
යටිපිල,
මිරිස්ස.

02-39

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

වංචාවල, පිලාන, වැපල්ලෙගේවත්ත, පදිංචි පියුමි නිරංජිකා විමලකීර්ති වන මම ගාල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ, 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පියුමි නිරංජිකා විමලකීර්ති.

2022 ජනවාරි මස මස 28 වැනි දින,
වැපල්ලෙගේවත්ත, පිලාන,
වංචාවල.

02-49

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

බණ්ඩාරගම, බද්දේගොඩ, දික්හේන්වත්ත, ග්‍රීන්පාක්, අංක 305/23, දරන ස්ථානයේ පදිංචි උඩුවරගේ සුලෝචනා මැණික් කුමාරි වන මම කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

උඩුවරගේ සුලෝචනා මැණික් කුමාරි.

අංක 305/23,
ග්‍රීන් පාක්,
දික්හේන්වත්ත,
බද්දේගොඩ,
බණ්ඩාරගම.

02-50

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

අංක 199/1, උතුරු ඇටියාවල, දන්කොටුව දරන ස්ථානයේ පදිංචි මානික්කුගේ ඉරෝමි චන්ද්‍රමාලි සිල්වා වන මම පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මානික්කුගේ ඉරෝමි චන්ද්‍රමාලි සිල්වා.

2022 ජනවාරි මස මස 31 වැනි දින,
අංක 199/1,
උතුරු ඇටියාවල,
දන්කොටුව.

02-53

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2022 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| පෙබරවාරි | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2022.04.01 | සිකුරාදා | 2022.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.08 | සිකුරාදා | 2022.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.12 | අඟහරුවාදා | 2022.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.22 | සිකුරාදා | 2022.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.29 | සිකුරාදා | 2022.04.12 | අඟහරුවාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.